## යාපනය විශ්වවිද්‍යාලය - 2014

යාපනය විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107 (5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට යාපනය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති ( ශ්‍රී ලං රා ගි ප්‍ර )

**ශ්‍රී ලං රා ගි ප්‍ර 7 - දේපල, පිරියත හා උපකරණ**

සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද හා සමාලෝචිත වර්ෂයේ අඛණ්ඩව භාවිතා කරන ලද මුළු පිරිවැය රු.6,836,600 ක් වූ උපාධි ලෝගු සහ පදක්කම් ආදී ස්ථාවර වත්කම් ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2013 හා 2014 වර්ෂ තුළ ලැබී තිබූ රු.250,114 ක් වටිනා ගබඩා අයිතමයන් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) කිලිනොච්චි ඉංජිනේරු පීඨය සඳහා ඉඩම් සලකුණු කිරීම 2013 වර්ෂය තුළදී මැනුම්පති දෙපාර්තමේන්තුව විසින් රු.3,332,634 ක පිරිවැයකට නිම කර තිබුණි. කෙසේ වුවද මැනුම්පති දෙපාර්තමේන්තුවට ගෙවන ලද අත්තිකාරම නිරවුල් නොකිරීම හේතුවෙන් මෙම වියදම ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) වටිනාකම රු.4,884,597 ක් වූ විදුලි සැපයුම් වැඩ 5 ක් 2013 වර්ෂය තුළ නිම කර විශ්වවිද්‍යාලයට භාර දී තිබුණි. කෙසේ වුවද ලංකා විදුලි බල මණ්ඩලය විසින් 2015 ජුලි 31 දක්වාත් වැඩ නිම කිරීමේ සහතිකය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එය ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) වටිනාකම රු.520,957,509 ක් වූ ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ 2014 වර්ෂය තුළදී නිමකර තිබුණද, එය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.402,939,785 ක් ලෙස දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස දේපල, පිරියත හා උපකරණවල වටිනාකම රු.118,017,724 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) වර්ෂ කිහිපයකට පෙර එවකට උතුරු නැගෙනහිර පළාත් සභාවට ගෙවන ලද රු.9,816,163 ක අත්තිකාරමක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. තවද අදාළ පළාත් සභාවට අත්තිකාරම් ගෙවන ලද දිනය විගණනයට ඉල්ලා සිටියද ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.2.3 අවිනිශ්චිත ගිණුම

2012 වර්ෂයේ සිට රු.288,204 ක ශේෂයක් නිරවුල් කිරීමෙන් තොරව අවිනිශ්චිත ගිණුමේ දක්වා තිබුණි. මෙම කරුණ 2012 වර්ෂයේ සිට මාගේ පෙර වර්ෂ විගණන වාර්තාවලින්ද වාර්තා කරන ලද නමුත් අදාළ අධිකාරීන් විසින් මේ සම්බන්ධයෙන් අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම

කරුණ 2014 අගෝස්තු 22 පවත්වන ලද පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී ද සාකච්ඡා කරන ලද අතර පාලක සභාවේ අනුමැතිය සහිතව මෙම කරුණ පැහැදිලි කරගැනීම සඳහා උපකුලපතිවරයා එකඟ වී තිබුණි.

**2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 6 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණු රු.454,810 ක් වූ හිඟ හිටි ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට හෝ ලියා හැරීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අඩමාණ ණය සඳහා ප්‍රතිපාදනය කර නොතිබුණි.

(ආ) නොගෙවූ ශේෂවල ඇතුළත් රු.2,807,386 ක් වූ ගෙවිය යුතු ශේෂ වර්ෂ 7 කට වැඩි කාලයක් නිරවුල් නොකර පැවතුණි.

(ඇ) 1986 සිට 2004 දක්වා කාල පරිච්ඡේදය තුළ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට ගෙවන ලද එකතුව රු.842,824 ක් වූ අත්තිකාරම් 9 ක් මෙම වාර්තාවේ දිනය දක්වා නිරවුල් කර නොතිබුණි.

(ඈ) රු.97,655 ක් වූ නොගෙවන ලද විභාග හිමිකම් ඉල්ලීම්, අදාළ පාර්ශවයන්ට හිමිකම් ගෙවීමෙන් තොරව වර්ෂ 10 කට වැඩි කාලයක් තැන්පතු ගිණුම්වල තබා තිබුණි.

(ඉ) ලැබිය යුතු මුදල් අය කර ගැනීමට කඩිනම් පියවර ගැනීමෙන් තොරව රු.1,857,491 ක් වූ සේවක ණය ශේෂය වර්ෂ 7 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ඊ) ව්‍යවහාර විද්‍යා පීඨය සඳහා අර්ධ ස්ථිර දේශන ශාලා අංක - 01 ඉදිකිරීම සම්බන්ධයෙන් ගෙවන ලද රු.1,676,432 ක අත්තිකාරම පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් නිරවුල් කර නොතිබුණි.

(උ) පාරිභෝගික විෂයයන් හා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2006 වර්ෂයේදී නිලධාරියෙකුට ගෙවන ලද රු.1,121,194 ක් වූ, නිරවුල් නොකරන ලද අත්තිකාරම සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි.

(ඌ) 2001 සිට 2013 කාල පරිච්ඡේදය තුළදී කලා ගොඩනැගිලි පද්ධතිය, රාමනාදන් ලලිත කලා පීඨය, කෘෂිකර්ම ස්වභාවික විද්‍යා ඒකකය හා වෛද්‍ය පීඨය සඳහා ශ්‍රවණාගාරය, කලා පීඨය සඳහා ව්‍යුහය (කයිලාසපති ශ්‍රවණාගාරය), ව්‍යාපාර අධ්‍යයන පීඨය හා වවුනියා පීඨයේ III අදියර ඉදිකිරීම් ආදී විවිධ ඉදිකිරීම් වැඩ සඳහා ගෙවන ලද එකතුව රු.37,171,324 ක් වූ අත්තිකාරම් 2015 ජුලි 31 වන විටත් නිරවුල් කර නොතිබුණි.

(එ) පොත් හා වාර සඟරා සැපයීම සඳහා 2010 සිට 2014 දක්වා කාලපරිච්ඡේදය තුළ විවිධ සැපයුම්කරුවන්ට ගෙවන ලද එකතුව රු.13,639,960 ක් වූ අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි.

(ඒ) කිලිනොච්චි ආරක්ෂක සේවා මූලස්ථානය, උසස් අධ්‍යයනය සඳහා ජාතික මධ්‍යස්ථානය, පර්යේෂණ ප්‍රදාන, අධ්‍යාපන විද්‍යා, නඩත්තු වැඩ, විවිධ වියදම්, සැපයුම් අත්තිකාරම්, උතුරු නැගෙනහිර පළාත් සභාව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලසුම් ගිණුම, පර්යේෂණ ප්‍රදාන (ජාතික තේමාගත පර්යේෂණ වැඩසටහන) ප්‍රදර්ශන, කාන්තා බලගැන්වීම් ව්‍යාපෘතිය හා ලිපිද්‍රව්‍ය ආදී විවිධ කාර්යයන් සඳහා විවිධ ආයතනයන්ට ගෙවන ලද එකතුව රු.22,411,763 ක් වූ අත්තිකාරම් 2015 ජුලි 31 වන විටත්

අය කර ගෙන නොතිබුණි. තවද මෙම මුදල්වලින් රු.104,050 ක් වර්ෂ 10 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.69,522,188 ක් වටිනාකම වූ පරිත්‍යාග, වාහන අනතුරු හේතුවෙන් දරන ලද පාඩු, හානි, පීඨ මණ්ඩලවල තීරණ, පර්යේෂණ දීමනා ගෙවීම, අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම, නේවාසිකාගාර කුලී ආදායම හා නිරවුල් නොකරන ලද අත්තිකාරම් ආදී විෂයයන්වල විශ්වාසදායී බව හා නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

- විදේශ රටවල්/ තානාපති කාර්යාලවලින් ලැබුණු පරිත්‍යාග පිළිබඳ විස්තරාත්මක වාර්තා
- විශ්ව විද්‍යාල සනාථන සභාවේ සටහන්
- අනතුරු/ පාඩු වාර්තා
- අධ්‍යයන වැඩසටහන් පිළිබඳ විස්තර
- අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් නිමකරන ලද පර්යේෂණ පිළිබඳ විස්තර
- නේවාසිකාගාර කුලී ලේඛනය
- නිරවුල් නොකරන ලද අත්තිකාරම් ලේඛනය

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය** | |
| (i) XXII පරිච්ඡේදයේ II.I වගන්තිය | වර්ෂ 1 ක් හා මාස 8 ක් ගතවීමෙන් පසුවත් රු.1,572,450 ක් වූ වංචනික ගෙවීම සඳහා වගකිව යුතු පුද්ගලයන් පිළිබඳව විනය ක්‍රියාමාර්ග ගැනීම හා චෝදනා පත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් කටයුතු ආරම්භ කර නොතිබුණි. |
| (ii) XXVI පරිච්ඡේදයේ 2,3 හා 4 වගන්ති | ප්‍රකාශන හා පුස්තකාල පොත් තොගය වාර්ෂිකව සමීක්ෂණය කර නොතිබුණි. |
| (iii) XXVII පරිච්ඡේදයේ 3.1 වගන්තිය | විශ්වවිද්‍යාලයේ හා වවුනියා මණ්ඩපයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම පිළිබඳ නීති හා රෙගුලාසි අනුගමනය කිරීම සඳහා පොදු ව්‍යාපාර කමිටුව විසින් තීරණයක් ලබා දී තිබුණද, පැමිණීම් ලේඛනයේ පැමිණීම් හා පිටවීම් වාර්තා කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 135 (4) | ගණන් දීමේ නිලධාරීන් විසින් කාර්යයන් පැවරීම පිළිබඳ වාර්ෂික විස්තරාත්මක යාවත්කාලීන කරන ලද බලතල පැවරීම් උපලේඛනයන් විගණනයට |

| | | |
|---|---|---|
| | | ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 136 (6) | අධිකාරී බලයලත් පුද්ගලයන්ගේ වාර්තා සටහන් සහතික කිරීමේ නිලධාරීන්ගේ එම වාර්තා සමඟ අවම වශයෙන් මාසයකට වරක් සසඳා සංසන්දනය කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 140 (3) | එකතුව රු.1,572,450 ක් වූ වංචනික වවුචර් 6 ක් සම්බන්ධයෙන් ගෙවීම් කිරීමට පෙර මූල්‍යාධිකාරීගේ විශේෂ දැනුම තුළ කිසිදු කරුණක් පිරික්සා බැලීමට හා විධිමත්ව ගිණුම් වලට ගැනීමට ඔහුට නොහැකි වී තිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 272 (3) | ගෙවීම් වවුචර් අදාළ වන මාසය අවසානයේ සිට සති 6 ක් ඇතුළත කිසිදු ගෙවීම් වවුචරයක් මාසිකව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 1645 | වාහන භාර නිලධාරියා විසින් එක් එක් වාහනය මඟින් සිදුකරන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශ හා සෑම මාසයක් සඳහා දෛනික ධාවන සටහන් අදාළ ආයතන ප්‍රධානියා මඟින් ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. 2015 මැයි මාසය සඳහා පමණක් දෛනික ධාවන සටහන් වාර්තා විගණනයට ඉදිරිපත් කර තිබුණි. |

**(ඇ) චක්‍රලේඛ විධිවිධාන**

| | | |
|---|---|---|
| (i) | 1980 පෙබරවාරි 25 දිනැති අංක 63 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | අයවැයගත හා තථ්‍ය ආදායම සහ වියදම අතර විචලනයන් දැක්වෙන වාර්තාවක් හා එම විචලනයන් සඳහා හේතු සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහනවල ඉන්ධන පරිභෝජනය අවම වශයෙන් මාස 6 කට වරක් පරීක්ෂා කළ යුතුය. එසේ වුවද විශ්වවිද්‍යාලයට අයත් වාහන 17 ක් සම්බන්ධයෙන් එම පරිපාටිය අනුගමනය කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.124,793,315 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.119,128,668 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,664,647 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. නඩත්තු වියදම් රු.4,498,658 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය තුළ විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය සාධනය පහත පරිදි වේ.

#### (අ) විභාග ප්‍රතිඵල

1995 ජුලි 14 දිනැති අංක 636 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව, විභාග පැවැත්වීමෙන් පසු මාස 3 ක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතුය. කෙසේ වුවද විශ්ව විද්‍යාලයේ එක් එක් පීඨයන් යටතේ පවත්වන විවිධ පාඨමාලා සඳහා විභාග පැවැත්වීමේ දිනයන් හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ ඉලක්ක දිනයන් තීරණය කර නොතිබුණි. 2013 හා 2014 වර්ෂයන් තුළ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම, කලා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ, විද්‍යා හා බාහිර විභාග ඒකක පීඨයන්හි විභාග පැවැත්වීමේ දිනයේ සිට ප්‍රතිඵල නිකුත් කිරීමේ දිනය දක්වා මාස 04 සිට මාස 15 දක්වා සැලකිය යුතු කාල පරිච්ඡේදයක ප්‍රමාදයන් තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. එමගින් නියමිත කාලය තුළදී ශිෂ්‍යයින්ට රැකියා අවස්ථාවන් ලබා ගැනීමේ හැකියාව අහිමි කර තිබුණි. මෙම කරුණ මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන්ද පෙන්වා දී තිබුණද, ඉහත චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල වන පරිදි ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා අදාළ අධිකාරීන් විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

#### (ආ) ඒක ශිෂ්‍ය පිරිවැය

විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි වී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව හා සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය තුළදී දරන ලද මුළු වියදම පහත දැක්වේ.

| | 2014 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| පීඨය | මුළු පිරිවැය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | ඒක ශිෂ්‍ය පිරිවැය | මුළු පිරිවැය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | ඒක ශිෂ්‍ය පිරිවැය |
| | රු. | | රු. | රු. | | රු. |
| කලා | 308,724,672 | 3,137 | 98,414 | 266,922,273 | 2,917 | 91,506 |
| කෘෂිකර්මය | 85,478,313 | 295 | 289,757 | 69,307,096 | 198 | 350,036 |
| ඉංජිනේරු | 24,980,617 | 100 | 249,806 | 3,897,490 | 208 | 18,738 |
| වෛද්‍ය | 173,276,479 | 830 | 208,767 | 141,471,824 | 498 | 284,080 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ | 74,631,840 | 1,484 | 50,291 | 59,832,990 | 894 | 66,927 |
| විද්‍යා | 214,633,877 | 1,213 | 176,945 | 185,859,387 | 662 | 280,754 |
| ව්‍යවහාර විද්‍යාව - වවුනියා මණ්ඩපය | 61,068,982 | 678 | 90,072 | 50,672,015 | 214 | 236,785 |
| ව්‍යාපාර අධ්‍යයනය - වවුනියා මණ්ඩපය | 45,845,882 | 571 | 80,290 | 37,184,657 | 132 | 281,702 |
| එකතුව | 988,640,662 | 8,308 | | 815,147,732 | 5,723 | |

සමාලෝචිත වර්ෂය තුළ ඉහළම ඒක ශිෂ්‍ය පිරිවැය වූ රු.289,757 ක් කෘෂිකර්ම පීඨයෙන් වාර්තා වී තිබූ අතර අඩුම ඒක ශිෂ්‍ය පිරිවැය වූ රු.50,291 කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයෙන් වාර්තා වී තිබුණි.

**(ඇ) මහපොළ**
**----------**

සමාලෝචිත වර්ෂය තුළ රු.38,114,100 ක මුදලක් "මහපොළ" ලෙස ශිෂ්‍යයින්ට ගෙවා තිබුණි. කෙසේ වුවද රු.1,155,150 ක මුදලක් ශිෂ්‍යයින්ට ගෙවා නොතිබූ අතර, ශිෂ්‍යයින් සමඟ කාලීනව සන්නිවේදනය කිරීමට නොහැකි වීම හේතුවෙන් මෙම මුදල මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදලට ආපසු ගෙවා තිබුණි.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**
**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පවත්නා සෘජු දුරකථන මාර්ග අඩු කිරීම මගින් නිල දුරකථන ගාස්තු අඩුකිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් 2011 ජනවාරි මාසයේදී ඉන්ටර් කොම් පහසුකම් ස්ථාපනය කර තිබුණි. කෙසේ වුවද බැහැරට ගන්නා ඇමතුම් ඉන්ටර් කොම් මාර්ග හරහා ලබා ගැනීම හේතුවෙන් හා බැහැර දුරකථන ඇමතුම් පිළිබඳ පාලනයක් නොමැති වීම හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ දුරකථන ගාස්තු රු.5,683,904 කින් හෙවත් සියයට 29 කින් වැඩි වී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය සතුව අමුත්තන් සඳහා නිවසක් යාපනයේ තිබුණද, එම නිවස විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විසින් 2009 අප්‍රේල් මාසයේ සිට කිසිදු කුලී ගෙවීමකින් තොරව පදිංචියට ලබා ගෙන ඇති බැවින් විශ්ව විද්‍යාලයට බාහිරින් පැමිණෙන නිලධාරීන්ට පුද්ගලික හෝටල්වල නවාතැන් පහසුකම් සපයා තිබුණි. මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළදී විශ්ව විද්‍යාලයට පැමිණි නිලධාරීන් සඳහා නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් රු.735,809 ක මුදලක් ගෙවා තිබුණි.

**4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**
**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයෙන් ශිෂ්‍යත්ව මත ගිය කථිකාචාර්යවරුන් 86 දෙනෙකු ශිෂ්‍යත්ව සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු රාජකාරී සඳහා වාර්තා කර හෝ විශ්වවිද්‍යාලයෙන් ඉවත් වී නොතිබුණි. කෙසේ වුවද ගිවිසුම් කඩ කිරීම පිළිබඳව එම කථිකාචාර්යවරුන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු එකතුව රු.73,740,389 ක මුදලක් හා වවුනියා මණ්ඩපයේ බැඳුම්කර ගිවිසුම කඩ කිරීම හේතුවෙන් නිලධාරීන් 4 දෙනෙකුගෙන් අය විය යුතු රු.9,786,272 ක් වූ බැඳුම්කර ගිවිසුම්ද විශ්වවිද්‍යාලය විසින් 2015 නොවැම්බර් 24 වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) පුස්තකාල පොත් හා වාර සඟරා ලැබීමෙන් තොරව ගෙවීම් කිරීම හේතුවෙන් එකතුව රු.1,572,450 ක ගෙවීම් වවුචර් 20 ක් මගින් ව්‍යාජ ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් ගෙවීම අය කරගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(ඇ) විවිධ වර්ෂවලදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට (මධ්‍යම) එකතුව රු.1,545,255 ක් වූ අත්තිකාරම් විවිධ කාර්යයන් සඳහා ගෙවා තිබුණි. කෙසේ වුවද ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වැඩ ආරම්භ කර නොතිබූ අතර අත්තිකාරම් මුදල විශ්වවිද්‍යාලයට ආපසු ගෙවනවා වෙනුවට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් රජයේ ආදායම් ගිණුමට බැර කර

තිබුණි. මේ සම්බන්ධයෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවන ලද මුදල ආපසු අයකර ගැනීමට විශ්ව විද්‍යාලය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) පුද්ගලික සමාගමකින් රු.3,150,000 ක පිරිවැයකට විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීම බාහිරින් සිදු කර ගැනීමේ සේවාව සඳහා 2013 නොවැම්බර් 18 දින විශ්වවිද්‍යාලය විසින් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව එම කාර්යය 2014 මැයි 31 දිනට හෝ ඊට පෙර නිම කළ යුතු විය. කෙසේ වුවද එම කාර්යය 2015 ජූලි 31 දක්වා වර්ෂ 01 මාස 03 ක් ගත වීමෙන් පසුවත් නිම කර නොතිබුණි.

(ඉ) යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියා මණ්ඩපය විසින් "ජිම්නේසියම්" උපකරණ මිලදී ගැනීම සඳහා රු.799,228 ක මුදලක් ගෙවා තිබුණි. 2015 අගෝස්තු 18 දින කරන ලද භෞතික පරීක්ෂණයේදී ඉහත සඳහන් විෂයයන් විධිමත්ව නඩත්තු කර නොතිබූ බවත්, එම යන්ත්‍ර ශිෂ්‍යයින් විසින් භාවිතා කරන බවට වාර්තා එහි නොතිබූ බවත් අනාවරණය විය.

(ඊ) රු.398,000 කට "ෆොක්ස්ටේල්" ගස් 80 ක් මිලදීගෙන පම්පායිමාඩු හි ව්‍යාපාර අධ්‍යයන පීඨයේ ප්‍රවේශ මාර්ගයේ සිටුවා තිබුණි. 2015 අගෝස්තු 07 දින සිදු කරන ලද භෞතික පරීක්ෂණයේදී අවිධිමත් නඩත්තු කිරීම හේතුවෙන් එම ගස් 8 ක් සම්පූර්ණයෙන් හානි වී තිබූ බව අනාවරණය විය.

(උ) කෘෂිකර්ම පීඨයේ බිම් දසුන් සැකසීම සඳහා කිලිනොච්චි ආරක්ෂක මූලස්ථානයට රු.4,266,737 ක මුදලක් අවස්ථා දෙකකදී අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. කෙසේ වුවද බිම් දසුන් සැකසීමට අදාළ වැඩ නිම කළ බවට තහවුරු කර ගැනීම සඳහා කිසිදු සාක්ෂියක් ලබා ගැනීමට නොහැකි විය. මේ සම්බන්ධයෙන් ගෙවන ලද අත්තිකාරම අය කර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඌ) විවිධ වර්ගයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ ප්‍රභවයන්ගෙන් ලැබුණු රු.8,110,136 ක මුදලක් අරමුණු කළ කාර්යයන් සඳහා සම්පූර්ණයෙන් උපයෝජනය කර නොතිබූ අතර වැය නොකළ ශේෂ ලෙස වර්ෂ 10 කට වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(එ) අත්තිකාරම් නියාමනය හා පාලනය පිළිබඳ විධිමත් යාන්ත්‍රණයක් විශ්වවිද්‍යාලය විසින් හඳුන්වා දී නොතිබූ අතර ගෙවීම පිළිබඳ තථ්‍ය අවශ්‍යතාවය ඇගයීමකින් තොරව විවිධ නිලධාරීන්ට අත්තිකාරම් ගෙවා තිබුණි. තවද නිලධාරීන් විසින් අත්තිකාරම් නිරවුල් කිරීමේදී සැලකිය යුතු කාල ප්‍රමාදයන් තිබූ බව නිරීක්ෂණය වූ අතර විවිධ කාර්යයන් සඳහා පෙර ලබාගත් අත්තිකාරම් නිරවුල් කිරීම පිළිබඳ සැලකීමෙන් තොරව අත්තිකාරම් ගෙවා තිබුණි.

**4.4 පුස්තකාල පරිපාලනය**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුස්තකාලයෙන් පොත් ලබාගන්නා ලද අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 31 දෙනෙකු විසින් පොත් 79 ක් නිශ්චිත කාල පරිච්ඡේදය තුළදී ආපසු භාර දී නොතිබුණි. 2010 වර්ෂය සිට 2015 දක්වා කාල පරිච්ඡේදය තුළ හිඟ හිටි පොත් ආපසු ලබාගැනීම හෝ ප්‍රමාදයන් සඳහා දඩ මුදලක් පැනවීමට මේ සම්බන්ධයෙන් විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

(ආ) 2006 වර්ෂයේ සිට සැපයුම්කරුවන්ගෙන් විශ්වවිද්‍යාලයට ලැබී නොතිබුණු රු.2,337,908 ක් වටිනා පොත්, සඟරා හා වාර සඟරා 724 ක් පිළිබඳව විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර නොතිබුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 සිට 2013 මාර්තු දක්වා කාල පරිච්ඡේදය තුළ එකතුව රු.1,572,450 ක් වූ ගෙවීම් වවුචර් 20 ක් මඟින් මිලදී ගන්නා ලද පොත් හා වාර සඟරා සඳහා ගෙවීම එම පොත් ලැබීමෙන් තොරව ගෙවා තිබූ හෙයින් ව්‍යාජ ගෙවීමක් විය. මේ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන්ගෙන් අදාළ ගෙවීම අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි. තවද මෙම ගෙවීම පොත් හා වාර සඟරා පාඩු අවිනිශ්චිත ගිණුමට ජර්නල් සටහනක් මඟින් මාරු කර තිබූ අතර පාඩුව අයකර ගැනීමේ අරමුණින් අභ්‍යන්තර හා බාහිර විමර්ශන ක්‍රියාවලියක් සිදු කරමින් පවතී.

(ආ) 2013 වර්ෂය තුළදී ප්‍රජා හා පවුල් සෞඛ්‍ය ඒකක ප්‍රධානීගේ නිවසින් රු.110,000 ක් පිරිවැය වූ ලැප්ටොප් පරිගණකයක් නැති වී තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව මූලික විමර්ශනයක් සිදු කිරීමට හා අදාළ නිලධාරියාගෙන් පාඩුව අයකර ගැනීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) හෙද ඒකකයේ සම්බන්ධීකාරකගෙන් රු.104,220 ක් වටිනා වෙනත් පරිගණකයක් නැති වී තිබුණි. මේ සම්බන්ධයෙන් පාලක සභාවේ තීරණය පදනම් කර ගෙන විශ්ව විද්‍යාලය විසින් පාඩුවේ වගකීම නියම කර තිබූ අතර සම්පූර්ණ ප්‍රසම්පාදන පිරිවැය වූ රු.115,800 අදාළ නිලධාරියාගෙන් අයකර ගැනීමටද තීරණය කර තිබුණි. කෙසේ වුවද 2015 සැප්තැම්බර් 02 දක්වා වර්ෂ 2 ක් ගතවීමත් එම නිලධාරියාගෙන් පාඩුව අයකර ගෙන නොතිබුණි.

(ඈ) 2014 වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් වාර්තාකරන ලද ඌනතා හා පාඩු 821 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 4.6 මානව සම්පත් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුරප්පාඩු 395 ක් පිරවීම සඳහා විශ්වවිද්‍යාලය විසින් 2014 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ පීඨ 7 ක මහාචාර්ය, සහාය මහාචාර්ය තනතුරු ආදී ප්‍රධාන අධ්‍යයන තනතුරු 136 ක පුරප්පාඩු පැවතුණි. කෙසේ වුවද මෙම පුරප්පාඩු පිරවීම සඳහා විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය විසින් පත්කරන ලද නිලධාරීන් 1,241 දෙනෙකු පිළිබඳ අධ්‍යාපනික සුදුසුකම් සනාථ කරගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 21 වගන්තිය ප්‍රකාරව වසර ගණනාවක් තිස්සේ සිදුකර නොතිබුණි.

(ඈ) ඉංජිනේරු හා කෘෂිකර්ම පීඨයන් හා වෙනත් දෙපාර්තමේන්තු හා ඒකක වල අධ්‍යයන කාර්යයන් පසුගිය වර්ෂ 2 ක් තුළ ව්‍යාප්තව තිබුණද, සේවක සංඛ්‍යාව වැඩි කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඉ) මූල්‍යාධිකාරී, නියෝජ්‍ය මූල්‍යාධිකාරී, ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී හා සහකාර මූල්‍යාධිකාරී, නියෝජ්‍ය අභ්‍යන්තර විගණක යන තනතුරු සඳහා පත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

තවද විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ස්ථිර තනතුරු වල රාජකාරී, පුහුණුවන කළමනාකරණ සහකාරවරුන් 30 දෙනෙකු විසින් ආවරණය කර තිබුණි.

**4.7 කොන්ත්‍රාත් පරිපාලනය**

රු.602,262 ක වටිනාකමට කිලිනොච්චි, අරිවියල් නගර් හි නිල නිවාස ඉදිකිරීම සම්බන්ධයෙන් කාර්යයන් 15 ක් කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. පසුව විධිමත් ප්‍රසම්පාදන පරිපාටියක් අනුගමනය කිරීමෙන් තොරව 2014 වර්ෂය තුළදී වෙනත් කොන්ත්‍රාත්කරුවකු මගින් මෙම කාර්යයන් සිදු කර ගෙන තිබුණි.

**4.8 මතභේදයට තුඩුදෙන කරුණු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පැමිණීමේ ලේඛනය දීර්ඝ කාලයක සිට පවත්වා නොතිබුණි. එබැවින් නිලධාරීන් විසින් ලබාගත් නිවාඩු හා සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය මණ්ඩලයට ගෙවන ලද වැටුප්වල නිරවද්‍යතාවය විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය. මේ සම්බන්ධයෙන් 2014 අගෝස්තු 22 දින පවත්වන ලද රාජ්‍ය ව්‍යාපාර කමිටුව මගින්, විශ්වවිද්‍යාලයට අනුයුක්ත සියලුම කාර්ය මණ්ඩලය විසින් රීති හා රෙගුලාසි අනුගමනය කළ යුතු බවට නියෝග කර තිබූ අතර පැමිණීමේ ලේඛනයේ නිවැරදි වේලාවට ලේඛනය වැසීම සඳහා ද ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට/ ගණන් දීමේ නිලධාරියාට නියෝග කර තිබුණි. කෙසේ වුවද මෙම නියෝගය විශ්වවිද්‍යාලය විසින් 2015 සැප්තැම්බර් 02 විගණන දිනය දක්වාම අනුගමනය කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2010 පෙබරවාරි 15 දිනැති අංක 02/2010 දරන ආයතන චක්‍රලේඛය ප්‍රකාරව, 2011 වර්ෂය තුළ මිලදී ගන්නා ලද රු.779,520 ක් වටිනා ඇඟිලි සලකුණු ස්කැනර් යන්ත්‍ර 12 ක් විශ්වවිද්‍යාලයේ සියලු අංශවල ඵලදායී ලෙස ස්ථාපනය කර නොතිබුණි.

**4.9 අවිධිමත් ගනුදෙනු**

එකතු කළ අගය මත බදු ලියාපදිංචි අංකවල වලංගුභාවය හා ගෙවීම් කරන අවස්ථාවේදී එකතු කළ අගය මත බදු ඉන්වොයිසි පරීක්ෂා කිරීමෙන් තොරව ඉදිකිරීම් වැඩ සඳහා විශ්වවිද්‍යාලය විසින් එකතුව රු.1,255,459 ක් වූ එකතු කළ අගය මත බදු (VAT) ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරුවන් විසින් සඳහන් කරන ලද එකතු කළ අගය මත බදු අංක අක්‍රීය බව පසුව නිරීක්ෂණය වී තිබුණි.

**4.10 ප්‍රසම්පාදන පරිපාටියට අනුකූල නොවීම**

සමාලෝචිත වර්ෂය තුළ කාර්යාල ලී බඩු හා උපකරණ, පොත් හා වාර සඟරා, උපාධි ලෝගු, දුරකථන හුවමාරු පද්ධති හා ලිපිද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම සඳහා රු.946,750,914 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන අත්පොතේ 4.2.1 වගන්තියට අනුව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 4.2.1 (ආ) වගන්තිය අනුව, අවම වශයෙන් වර්ෂ 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කාර්යයන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ ලැයිස්තු ගත කළ යුතුය. කෙසේ වුවද විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන කාර්යයන් ලැයිස්තු ගත කර තිබුණි.

(ඇ) ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ අංක 07 සිට අංක 13 දක්වා සඳහන් කරන ලද විෂයයන් සඳහා නිම කිරීමේ ඉලක්ක දිනයන් දක්වා නොතිබුණි.

(ඈ) ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කර නොතිබුණි.

(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 4.2.2 වගන්තිය අනුව, කාල ක්‍රමානුගත ක්‍රමයකට හා එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භයේ සිට නිම කිරීම දක්වා විස්තර කරමින් ප්‍රසම්පාදන කාල උපලේඛනයක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද කාල උපලේඛනය හා එක් එක් ප්‍රසම්පාදන කාර්යයේ පියවරයන් විශ්ව විද්‍යාලය විසින් පිළියෙල කර නොතිබුණි.

**4.11 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ වාහන 02 ක් 2006 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. කෙසේ වුවද විශ්වවිද්‍යාලය අරමුණු කළ කාර්යයන් සඳහා එම වාහන උපයෝජනය කිරීමට අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) එකතුව රු.264,879 ක් වූ ඉටිපන්දම්, පරිගණක කඩදාසි හා යතුරුලියන කඩදාසි ආදී පාරිභෝගික හා නඩත්තු විෂයයන් වර්ෂ 01 සිට වර්ෂ 15 දක්වා කාලයක් උපයෝජනය කිරීමෙන් තොරව විශ්වවිද්‍යාලයේ ගබඩාවල පැවතුණි.

(ඇ) වවුනියා මණ්ඩපයේ රු.12,861,777 ක් වටිනා පරිගණක හා උපාංග අරමුණු කළ කාර්යයන් සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) 2013 වර්ෂය තුළදී රු.4,308,000 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද පරිගණක 50 ක් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ වර්ෂ 1 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණද සමාලෝචිත වර්ෂය තුළදී රු.12,113,912 ක පිරිවැයකට පරිගණක හා උපාංග 100 ක් වවුනියා මණ්ඩපය විසින් ප්‍රසම්පාදනය කර තිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව, 2013 වර්ෂය සඳහා වාර්ෂික වාර්තා 2015 ජුලි 31 දක්වාත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව පහත සඳහන් ගනුදෙනු ක්ෂේත්‍ර අභ්‍යන්තර විගණන ඒකකය විසින් සම්පූර්ණයෙන් පරීක්ෂා කර / ආවරණය කර නොතිබුණි.

(අ) ප්‍රාග්ධන ව්‍යාපෘති හා කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ විගණනය
(ආ) නිරවුල් නොකළ අත්තිකාරම්
(ඇ) වාහන අනතුරු
(ඈ) පාඩු

**5.3 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි

**5.4 විගණන විමසුම් පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග**

2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා නිකුත් කරන ලද විගණන විමසුම් 04 කට පිළිතුරු සැපයීම සඳහා විශ්වවිද්‍යාලය පියවර ගෙන නොතිබුණි.

**5.5 අයවැය පාලනය**

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලන**

පද්ධති හා පාලන පිළිබඳ නිරීක්ෂණය වූ අඩුපාඩු උපකුලපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) පුස්තකාල පරිපාලනය
(ඇ) ගබඩා පරිපාලනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්
(ඊ) ප්‍රසම්පාදනයන්
(උ) මානව සම්පත් කළමනාකරණය
(ඌ) අයවැය
(එ) මාසික ඉදිරි වැඩසටහන් හා දින පොත්